**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

සමාජ විද්‍යාව - **SOCI - E 1015**

සමාජ විද්‍යාවේ මූලික සංකල්ප

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
කොටස් දෙකකින් යුත් ප්‍රශ්න තෝරාගන්නා විට එම කොටස් දෙකටම පිළිතුරු සැපයිය යුතුයි.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. 1. සමාජ විද්‍යාව විෂය බිහිවීමට බලපෑ ඓතිහාසික සාධක මොනවාද? (ලකුණු 10)

11. සමාජ විද්‍යාව විෂය සංවර්ධනය කෙරෙහි මැක්ස් වෙබර් හා එමිල් ඩර්කයිම් ගේ දායකත්වය පහදන්න. (ලකුණු 10)

02. දරුවෙකුගේ පෞර්ෂය සංවර්ධනය කෙරෙහි ප්‍රාථමික සමාජානුයෝජනයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. සමාජයක ඒකාබද්ධතාවය හා අනුකූලතාවය ආරක්ෂා කිරීමේ දී සමාජ පාලනය කොතෙක්දුරට වැදගත් වේද? (ලකුණු 20)

04. 1. සමාජ සමූහයක් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 10)

11. ප්‍රාථමික හා ද්විතීක සමාජ සමූහ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. 1. තත්ත්වය හා කාර්යභාරය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 10)

11. සමාජ පර්යාය පවත්වාගැනීම කෙරෙහි තත්ත්වයන් හා කාර්යභාරයන් කොතෙක්දුරට ඉවහල් වේද? (ලකුණු 10)

06. සමාජ ස්ථරායනය කාල්මාක්ස් හා මැක්ස් වෙබර් ගේ අදහස් ඇසුරින් හඳුන්වන්න. (ලකුණු 20)

07. "නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ විග්‍රහය ප්‍රායෝගික තත්වයෙන් බැහැරය." මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? (ලකුණු 20)

08. පහත මාතෘකා දෙකකට (02) සටහන් ලියන්න.

i. සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව
ii. විවාහය හා ඥාතීත්වය
iii. ඔගස්ට් කොම්ට්
iv. සමාජය

****************************